# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 92 — 1973 දෙසැම්බර් 28 වැනි සිකුරාදා — 1973.12.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිටු | | පිටු |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම ... | 253 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන | 254 | විවිධ දැන්වීම ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන | — | | |


**සැළකිය යුතුයි.**— ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම් පත; විදේශ විනිමය වැරදි කමා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම් පත සහ දේශීය ණය සහ සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම් පත 1973 දෙසැම්බර් 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පි  බඳ කාර්යාලය

**වෙළඳ ලකුණුවලට අදල සියලුම ලියුම් කියුම්, කොළඹ 1, ඇවිලන් වතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුය.**

### පරීක්ෂා කිරීමේ වේලාවන්

**සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරි දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වා ද සෑම වරුවේ දිනවල පෙරවරු නවයේ සිට පෙරවරු එකොලහයි තිහ දක්වා ද ලේඛණ පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරි දිනවල පස්වරු දෙක දක්වාද, වරුවේ දිනවල පෙරවරු එකොලහ දක්වා ද භාරගනු ලැබේ.**

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

**ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.**

### ආශ්‍රිත කිරීම්

**මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.**

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

**රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්‍යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්‍යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.**

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරයෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමඟ ටී.ඇම්. 7 දරන පෝරම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම් අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම් කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධවන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

(1) වෙළඳ ලකුණේ අංකය : 32,701. (2) ලැබුණු දිනය : 1970 මැයි මස 24 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : සුනි ලිවර් ලිමිටඩ් (බ්‍රිතාන්‍ය සමාගමකි) පෝට් සන්ලයිට්, විරල්, චෙෂයර්, එංගලන්තය, නිෂ්පාදකයෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ද ලිවර් බ්‍රදර්ස් (සිලෝන්) ලිමිටඩ්, තැ. පෙ. 283, කොළඹ. (5) පන්තිය : 48. (6) බඩු : සුවඳ ද්‍රව්‍ය (ප්‍රසාධන භාණ්ඩ දත් සහ හිසකෙස් සඳහා සම්මිශ්‍රණ සහ සුවඳ සබන් ඇතුළුව). (7) වෙළඳ ලකුණේ සටහන :

**ASPECT**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ජූලි මස 19 දින.

12–979—73. 12. 28 දින අංක 92 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,777 (2) ලැබුණු දිනය : 1971 අගෝස්තු මස 4 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ද සිලෝන් දයා ෂර්ට්ස් කො. ලිමිටඩ් (සමාගම් ආඥා පණත යටතේ විධිමත්ව ලංකාවේ සංස්ථාපිත සමාගමකි) අංක 1, යූනියන් පෙදෙස, කොළඹ 2, කමිස නිෂ්පාදකයෝ සහ බෙදා හරින්නෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ——. (5) පන්තිය : 38. (6) බඩු : මසා නිම කළ කමිස. (7) වෙළඳ ලකුණේ සටහන :

**TROJAN**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 සැප්තැම්බර් මස 21 දින.

12–1088—73. 12. 28 දින අංක 92 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,778. (2) ලැබුණු දිනය : 1971 අගෝස්තු මස 4 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ද සිලෝන් දයා ෂර්ට්ස් කො. ලිමිටඩ් (සමාගම් ආඥාපනත යටතේ ලංකාවේ සංස්ථාපිත සමාගමකි) අංක 1, යූනියන් පෙදෙස, කොළඹ 2, කමිස නිෂ්පාදකයෝ සහ බෙදාහරින්නෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය :——. (5) පන්තිය : 38. (6) බඩු : මසා නිම කළ කමිස. (7) වෙළඳ ලකුණේ සටහන :

**VISION**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 සැප්තැම්බර් මස 25 දින.

12–1087—73. 12. 28 දින අංක 92 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 33,779. (2) ලැබුණු දිනය : 1971 අගෝස්තු මස 4 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ද සිලෝන් දයා ෂර්ට්ස් කො. ලිමිටඩ් (සමාගම් ආඥා පණත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමකි) අංක 1, යූනියන් පෙදෙස, කොළඹ 2, කමිස නිෂ්පාදකයෝ සහ බෙදාහරින්නෝ. (4) ලියුම් භාර දීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ——. (5) පන්තිය : 38. (6) බඩු : මසා නිම කළ කමිස. (7) වෙළඳ ලකුණේ සටහන :

**HERALD**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 සැප්තැම්බර් මස 21 දින.

12–1089—73. 12. 28 දින අංක 92 දරන ගැසට් පත්‍රය

---

## වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන

### ශුද්ධියකි

අංක 66 හා 1973.06.29 දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 33,415 හා 1971 මාර්තු මස 16 දින දරණ වෙළඳ ලකුණ සම්බන්ධ නිවේදනයේ ආශ්‍රිත සටහනේ සඳහන් 24952 දරණ වෙළඳ ලකුණු අංකය වැරදි බැවින් එය 24592 වශයෙන් සංශෝධනය විය යුතුයි.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.


වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 නොවැම්බර් මස 6 දින.

12–868—73. 12. 28 දින අංක 92 දරන ගැසට් පත්‍රය

---

### ශුද්ධියකි

අංක 74 හා 1973 අගෝස්තු මස 24 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 30,886 හා 1968 නොවැම්බර් මස 21 වැනි දින දරණ වෙළඳ ලකුණ සම්බන්ධ නිවේදනයේ (7) වන අංකය යටතේ වූ වෙළඳ ලකුණු නිරූපනයේ පිහිටීම පහත සඳහන් ආකාරයට විය යුතුය.



ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
ඇම්ලන් චතුරශ්‍රය,
කොළඹ 1,
1973 ඔක්තෝබර් මස 22 දින.

2–869 —73. 12. 28 දින අංක 92 දරන ගැසට් පත්‍රය

**ශුද්ධියක්**

අංක 66 හා 1973.06.29 දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 33454 හා 1971 මාර්තු මස 28 දින දරණ වෙළඳ ලකුණ සම්බන්ධ නිවේදනයේ වෙළඳ ලකුණේ සටහන වැරදි බැවින් එය පහත සඳහන් අයුරු නිදොස් විය යුතුයි.

**HOSTALEN**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1973 ඔක්තෝබර් මස 22 වෙනි දින.

12–1085—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන **ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය** සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් **කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

## 1974

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි ... | 04.01.74 | සිකුරාද ... | 28.12.73 | සිකුරාද | දවල් | 12.00 |
| | 11.01.74 | සිකුරාද ... | 04.01.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 18.01.74 | සිකුරාද ... | 11.01.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 25.01.74 | සිකුරාද ... | 18.01.74 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි ... | 01.02.74 | සිකුරාද ... | 25.01.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 08.02.74 | සිකුරාද ... | 01.02.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 15.02.74 | සිකුරාද ... | 08.02.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 22.02.74 | සිකුරාද ... | 15.02.04 | සිකුරාද | දවල් | 12.00 |
| මාර්තු ... | 01.03.74 | සිකුරාද ... | 22.02.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 08.03.74 | සිකුරාද ... | 01.03.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 15.03.74 | සිකුරාද ... | 08.03.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 22.03.74 | සිකුරාද ... | 15.03.74 | සිකුරාද | දවල් | 12.00 |
| | 29.03.74 | සිකුරාද ... | 22.03.74 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.